සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

# පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා තඟන හපනුන්ට මඟ කියන

## "අදිති"

8

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- **පහත ලිපිය හොඳින් කියවන්න.**

නිවසේ දී,
2022.03.30

සෙත් වේවා!

මා හිතවත් තාරක,

ඔබගේ සැපදුක් කෙසේ ද? මම සුවෙන් සිටිනවා. ඔබගේ අම්මා, තාත්තා සහ අයියා ද සුවෙන් ඇතැයි සිතමි.

ශිෂ්‍යත්ව විභාගය අවසන් වූ පසු මම ඔබගේ නිවසට පැමිණෙන්නම්. එවිට අපට සෙල්ලම් කිරීමට හැකි වේවි. ඔබගේ ගමේ ඇවිදීමට ද මම ආශාවෙන් සිටිනවා මා පැමිණෙන දිනය ඔබට දන්වා එවන්නම්.

ඔබගේ පවුලේ සැම මතක් කල බව පවසන්න. ඔබ සැමට තෙරුවන් සරණයි.

හිතවත් මිතුරු,

සුදම්

**01. ලිපිය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

i. මෙම ලිපිය ලියන්නේ .......................... විසින් ........................ට ය.

ii. මෙම ලිපියේ ආශිර්වාදය සහ එයට යෙදී ඇති විරාම ලකුණු හඳුන්වන නාමය ලියන්න. ................................................

iii. ''මම සුවෙන් සිටිනවා'' මෙම වැකිය ලිඛිත බසින් ලියන්න.

.........................................................................................................

iv. 'කැමැත්තෙන්' යන පදයට සමාන පදයක් ලිපියෙන් තෝරා ලියන්න.

...........................................................

v. ලිපිය ලියන්නා මිතුරාගෙන් අසන ලද ප්‍රශ්නය කුමක් ද? ..............................................

vi. ලිපියේ සඳහන් බහුවචන අනුක්ත නාම පදය කුමක් ද? ...............................................

1x6=6

**02. පහත වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) වැරදි ලකුණ ද වරහන මත යොදන්න.**

i. මා දිනපතා ප්‍රවෘත්ති ඇසුවෙමි ( )

ii. අපි යහපත් මිතුරු ඇසුර පැතුවෙමු. ( )

iii. ළුණු අවට පිළිබඳ විමසිලිමත් ව පසු වුණෝ ය. ( )

1x3=3

**03. හිස්තැනට ගැළපෙන අකුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

i. නිය........ණු (ළු, ලු )

ii. ගු .......කිරීම (ළි, ලි )

iii. වි.......මයාදි ලකුණ ( ශ් , ස්)

1x3=3

04. **හිස්තැනට සුදුසු වචන වරහන තුළින් තෝරා වැකි සම්පූර්ණ කරන්න.**

(ඈ/ ඔහු/ ඔවුහු)

i. බින්දු සති අන්තයේ නිවාඩුවට ගමේ ගියේ ය. ..................සීයාගෙන් රස කතා අසා ගත්තේ ය.

ii. තාරදා දක්ෂ ගායිකාවකි. .......................... විවිධ භාෂාවලින් ගීත ගායනා කරයි.

iii. දිලේෂ හා දිමාල් හොඳ මිතුරෝය. .............................දුක සැප දෙකේ දී ම එකට සිටිති. 1x3=3

05. **පහත දී ඇති අදහස ප්‍රකාශ කරන තනි වචනය ලියන්න.**

i. කුඹුරක වැඩි ජලය බැසයාමට නියරෙහි කපන කපොල්ල. .................................

ii. දිනපතා සිදුකරන ................................ 1x2=2

06. **පහත ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.**

i. ගඟට .................................... වගේ. 1x1=1

07. **පහත වාක්‍යයේ ඉරි ඇඳි පදයට ගැළපෙන සමාන පදයක් යොදා වාක්‍ය නැවත ලියන්න.**

<u>සියපත්</u> පිරුණු වැව මනරම් ය.

........................................................................................................... 1x1=1

08. **පහත සඳහන් වචන ගළපා අර්ථවත් වාක්‍ය ලියන්න.**

යැ / රශ්මිය / අප්‍රමාණ / සූර්ය / සලසන්නේ / ලෝකයට / වැඩ

...........................................................................................................

රැඳී / සිටියේ / පිහාටුත් / ඈ / හකුළාගෙනයි

........................................................................................................... 1x2=2

09. **පහත සඳහන් වාක්‍ය වල සුදුසු විරාම ලකුණු යොදන්න.**

1. පැය අටකට පසු පියාපත් සලන හඬක් ඇසුණි
2. නගුල මම මීට කලින් දැකලා නැහැ රිසානා කීවා ය 1x2=2

10. **පහත දී ඇති සිංහල වචන සඳහා ඉංග්‍රීසි වචන ඉංග්‍රීසි අකුරෙන්ම ලියන්න.**

i. ඇස් -.................................

ii. හෙදිය -................................. 1x2=2

11. **පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යවල අර්ථය සිංහලෙන් ලියන්න.**

i. Vesak lantern -.................................

ii. How much is it ? -................................. 1x2=2

12. **පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

Where ............................ (does/do) you live? 1x1=1

13. **මේවායෙහි සිංහල තේරුම ලියන්න.**

පත්තොම්බදු -.................................

උංගළුක්කු වේණ්ඩුමා ? -................................. 1x2=2

14. **මෙහි දෙමළ තේරුම සිංහල අකුරින් ලියන්න.**


පුසා කොහේද? ................................................................ 1x1=1

15. විසිහතර දහස් විසි හතර ඉලක්කමෙන් ලියන්න. .................................

16. XV මෙහි අගය හින්දු අරාබි ඉලක්කමෙන් ලියන්න.................................

17. 2842ml මෙම දියර ප්‍රමාණය ලීටර් සහ මිලිලීටර් වලින් දක්වන්න .................................


18. ගණක රාමුවේ නිරූපණයවන සංඛ්‍යාව තවත් 129ක් එකතු කර ලැබෙන පිළිතුර දී ඇති ගණක රාමුවේ ඇඳ පෙන්වන්න.





19. කොටුව තුළ දී ඇති සංඛ්‍යා හයම අවරෝහණ පටිපාටියට දැක්වෙන සේ ලියන්න.

| | | |
|---|---|---|
| 969 | 669 | 996 |
| 596 | 696 | 569 |

.....................................................................

20. 


තාරාදියෙහි දැක්වෙන සීනි පැකට්ටුවේ බර කොපමණද?.................................

21. 


පැතුම් C හා D දක්වා ගමන් කිරීමේ දී උතුරු දිශාවට කීවරක් ගමන් කර තිබේ ද?

....................................

22. සත්තු වත්තක් නැරඹීමට දිනක් ළමයි 2084ක් ද වැඩිහිටියන් ඊට වඩා 125ක් අඩුවෙන් ද පැමිණියහ. සත්තු වත්ත නැරඹීමට එදින පැමිණි සියලුම දෙනා කොපමණ ද?.................................


23. රටාවේ ඊළඟ සංඛ්‍යා දෙක පිළිවෙළින් ලියන්න.

**5020, 5015, 5005, ...................., .........................**

24. මිලිලීටර් 350 බැගින් වූ වතුර වීදුරු 6ක් එක්තරා භාජනයකට දැමූවිට එම භාජනය සම්පූර්ණයෙන් ම ජලය පිරුණි. එම භාජනයේ ධාරිතාව කොපමණද? ..................................

25. යතුරු පැදියක් පෙට්‍රල් ලීටරයකින් කිලෝමීටර 60ක් ධාවනය කළ හැකිය. A නගරයේ සිට B නගරයට දුර කිලෝමීටර 240කි. මෙම යතුරුපැදියෙන් A නගරයේ සිට B නගරයට ගමන් කිරීම සඳහා කොමපණ පෙට්‍රල් ප්‍රමාණයක් අවශ්‍ය වේ ද?.................................

26. දී ඇති රූපයේ පාට කළ කොටස දශම සංඛ්‍යාවක් සේ ලියන්න.




..................................

27. මල්ලීගේ බර 12kg වේ.තාත්තා, මල්ලීගේ බර මෙන් පස් ගුණයක් බරය. මට වඩා මල්ලී 15kgක් බරින් අඩුය. මගේ හා තාත්තාගේ බරෙහි එකතුව කීය ද? ..................................

2x13=36

28. දින 5ක් තුළ විකුණූ පත්තර සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත තීර ප්‍රස්තාරයේ දක්වා ඇත. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.




i. අඟහරුවාදා සහා බ්‍රහස්පතින්දා විකුණූ පත්තර සංඛ්‍යාවේ එකතුවේත්, සඳුදා සහ සිකුරාදා පත්තර සංඛ්‍යවේ එකතුවේ වෙනස කීය ද? ..................................   1x2=2

ii. දින 5 තුළ විකුණූ පත්තර ප්‍රමාණය කොපමණ ද?.................................   1x1=1

29. ප.ව.10.45ට ගමන් ඇරඹූ බස් රථයක් පෙ.ව. 2.15ට ගමනාන්තයට ළඟා විය. ගමාන්තයට ළඟ වීමට බස් රථයට ගත වූ කාලය කොපමණ ද? .................................

2x1=2

- **30. සිට 59 දක්වා ප්‍රශ්නවල දී ඇති උපදෙස් අනුව පිළිතුරු තෝරා ඉරක් අඳින්න.**

30. ජාතික කොඩියේ කහ පැහැති සිංහයාගෙන් නිරූපණය වන්නේ,

1. ජාතික අභිමානය 2. සිංහල ජාතිය 3. ජාතික සමගිය

31. අපිරිසිදු මුළුතැන් ගෙයක දහවල් කාලයේ දී දක්නට ලැබෙන සතෙකි,

1. කැරපොත්තා 2. ගෙමැස්සා 3. මීයා

32. කරලක් තුළ ඇති බීජ සහිත වැලක් වන්නේ,

1. බණ්ඩක්කා 2. ලබු 3. මෑ

33. රාජ්‍ය ආයතනයක් වන්නේ,

1. සම්පත් බැංකුව
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
3. සෙලින්කෝ රක්ෂණ සමාගම

34. ''මෙරු'' යනුවෙන් හඳුන්වන සත්ත්වයන්ගේ මුල් අවස්ථාව

1. දළඹුවා 2. පණුවා 3. වේයා

35. දර්ශනීය කූඩුවක් සාදන කුරුල්ලෙකි,

1. බට්ටිච්චා 2. සැළලිහිනියා 3. වඩු කුරුල්ලා

36. සතුටින් ජීවත් වීමට ජීවිතයට ආභරණයක් බවට පත් කරගත යුත්තේ,

1. සරල බව
2. සංකීර්ණබව
3. ඉතා වටිනා මුදුමාල පැළඳීම

37. අපිරිසිදු ජලය මගින් බෝවන රෝගයකි,

1. කොළරාව 2. මැලේරියාව 3. බරවා

38. කර්මාන්ත ශාලාවකින් පිටවන තෙල් වැවකට යොමු කළ අවස්ථාවක දී සිදුවිය හැකි දේ කුමක් ද?

1. වැවේ මාළු මිය යාම
2. වැවේ ජලය කළු පැහැයට හැරීම
3. ඉහත සියල්ල ම

39. ශ්‍රී ලංකාවේ මාර්ග දැක්වෙන සිතියමක ප්‍රධාන මාර්ග හඳුනා ගැනීමට යොදා ඇති සම්මත වර්ණය වන්නේ,

1. කළු 2. රතු 3. කොළ

40. එළිමහන් පිටනියක රැඳී සිටින විට සිදුවීමට වඩාත් ඉඩ ඇති අනතුර වන්නේ,

1. විදුලි සැර වැදීම
2. නාය යෑම්වලට අසුවීම
3. අකුණු සැර වැදීම

41. ශරීරයේ හෝ ඇඳුම්වල ඇලවී ව්‍යාප්ත වන බීජ පමණක් අඩංගු පිළිතුර වන්නේ,

1. තුත්තිරි, හොර    2. තුත්තිරි, ඇපල    3. ඇපල , ගම්මාලු

42. වර්ෂාපතනය මැනීමට යොදා ගනු ලබන ඒකකය වන්නේ,

1. මිලි ලීටර්    2. මිලි මීටර්    3. ජල මීටර්

43. පිට වැට කැපීම සිදු කරන්නේ,

1. වී ගොවිතැනේ දී    2. ගෙවතු වගාවේ දී    3. වඩු කර්මාන්තයේ දී

44. වගා කටුයතුවල දී අස්වැන්න නාස්ති නොවන අවස්ථාවකි,

1. අධික වැසිවලට හසුවීමෙන්
2. විවිධ රෝග වැළඳීමෙන්
3. නිසි කලට අස්වැන්න නෙළා ගැනීමෙන්

45. කිසියම් පුද්ගලයෙක් සමාජයේ ප්‍රශංසාවට ලක් නොවන අවස්ථාවකි.

1. නීති විරෝධී මත් ද්‍රව්‍ය විකිණීම
2. හිංසනයට විරුද්ධ ව නැගී සිටීම
3. ගැටලුකාරී අවස්ථාවකදී සාමය පවත්වා ගැනීමට දායක වීම

46. සම්ප්‍රදායික සැරසිල්ලක් නිර්මාණය කිරීම සඳහා වඩාත් සුදුසු ද්‍රව්‍යයකි,

1. සෘජු ෆෝම්    2. ගොක් කොළ    3. ලී කුඩු

47. දැතිරෝද දැකිය හැකි උපකරණයක් වන්නේ,

1. මයිනහම    2. ඔරලෝසුව    3. ඩක්කුව

48. ආහාරයට ගන්නා තද කොළ පැහැති ශාක පත්‍රවල වැඩියෙන් ම අඩංගු පෝෂ්‍ය පදාර්ථය වනුයේ,

1. විටමින් A    2. විටමින් C    3. විටමින් D

49. රාත්‍රී කාලයට ක්‍රියාකාරිවන සතෙකු නොවන්නේ,

1. වවුලා    2. කණාමැදිරියා    3. කෝන්ඳුරුවා

50. කුඩා මසුන් අල්ලා ගැනීමට ධීවරයින් භාවිතා කරන කුඩා ගොටුවක් වැනි උපකරණයකි.

1. කිරිගොට්ට    2. අතංගුව    3. කෙමන

51. ශරීර ප්‍රමාණයෙන් කුඩා ම පක්ෂියා වන්නේ,

1. දෙමලිච්චා    2. පොල්කිච්චා    3. බට්ටිච්චා

52. වොලිබොල් හා ක්‍රිකට් ක්‍රීඩාවල යෙදීමේ දී ක්‍රීඩා පිටිය තුළ එක් පිළකට සිටිය යුතු ක්‍රීඩකයින් ගණන වන්නේ

1. 6 සහ 10කි   2. 6 සහ 11කි   3. 10 හා 6කි

53. වර්තමානයේ ගෑස් හිඟයක් සමඟ ආහාර පිසීමට බහුල ව භාවිතාවන ඉන්ධන වර්ගයක් වනුයේ,

1. දහයියා   2. දර   3. පොල් කටු

54. දිනපතා ප්‍රමාණවත් පරිදි ජලය පානය කිරීමෙනක් අපට ලැබෙන වාසියකි.

1. හම වියළීම.
2. මුත්‍රා කිරීමේ අපහසුව.
3. අධික තරබාරුව අඩු වීම.

55. ජලභීතිකාව බෝ කරන සතෙකු නොවන්නේ

1. බල්ලා ය.   2. උකුස්සා   3. බළලා ය.

56. වියළි කෝෂයක (බැටරි කැබැල්ලක) දැකිය හැකි දෙයකි

1. සූත්‍රිකාව   2. + හා - අග්‍ර   3. උතුරු හා දකුණු අග්‍ර

57. මිය ගිය පසු මාතෘදේහය නැහැවීම කරනු ලබන්නේ,

1. ඉස්ලාම් බැතිමතුන් ය.   2. හින්දු බැතිමතුන් ය.   3. කතෝලික බැතිමතුන් ය

58. කැලණි වැලි දුම්රිය මාර්ගය ලෙස හඳුන්වන්නේ,

1. කොළඹ සිට මඩකලපුව
2. කොළඹ සිට මාතර
3. කොළඹ සිට අවිස්සාවේල්ල

59. ලුණු සහිත පරිසරයක වැඩෙන පැළෑටියක බහුල ව ඇති පෝෂ්‍ය පදාර්ථය වන්නේ,

1. කැල්සියම්
2. අයඩීන්
3. යකඩ

1x30=30

60 දේශිය අනන්‍යතාවය විදහා දැක්වෙන අපේ **"පැරණි ජනකවි"** යන මාතෘකාව යටතේ වචන පහකට වැඩි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි අර්ථවත් වාක්‍ය තුනක් ලියන්න.

1. ..............................................................................................................................
..............................................................................................................................
2 ..............................................................................................................................
..............................................................................................................................
3. ..............................................................................................................................
..............................................................................................................................

2x3=3

අත් අකුරු සඳහා ලකුණු 2යි